www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හරිත හා වාම පක්ෂ ජර්මානු දේශපාලනයේ නව භූමිකාව වෙනුවෙන් පෙලගැසෙති

**SPD, Greens, Left Party groomed for new role in German politics**

2010 ජූලි 09

උතුරු රයින්-වෙස්ට්පේලියා ප්‍රාන්තය තුල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී-හරිත සුලුතර ආන්ඩුවක් පිහිටුවීම ජාතික තලයේදී ජර්මන් දේශපාලනය සඳහා ප්‍රමුඛ දේශපාලන අර්ථභාරයක් ගැබ්කර ගනියි.

ක්‍රිස්තියානි සමාජ සංගමය (සීඑස්යූ) හා නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (එෆ්ඩීපී) ද ඇතුලත් බර්ලිනයේ සන්ධාන ආන්ඩුව නායකත්වය දෙන ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමය (සීඩීයූ) පිලිබඳ මාධ්‍ය විවේචන මාස ගනනක් තිස්සේ වැඩෙමින් තිබේ.

ව්‍යාපාරික පුවත් පත් විශේෂයෙන්ම වෙස්ට්පේලියා අගනුවර වන ඩසල්ඩෝර්ෆ්හි පල කරන *හැන්ඩෙල්ස්බ්ලාට්, ෆැන්ක්ෆර්ටර් ඕල්ජෙමීනෙ සෙයිටුන්ග්* හා *ඩර් ස්පීගල්* චාන්සලර් ඇන්ජෙලා මර්කෙල්ට එරෙහිව දේශපාලන ප්‍රහාරයන් දියත් කර ඇත.

බැංකු සහ මහ ව්‍යාපාරිකයින් විසින් ඉල්ලා සිටින කප්පාදු පිලිවෙත් ක්‍රියාත්මක කිරීමට මර්කෙල්ගේ ආන්ඩුව බෙහෙවින්ම අසමත්වී ඇති බව පාලක ප්‍රභූවේ කොටස් කල්පනා කරති. සන්ධාන පාර්ශවකරුවන් අතර නැවත නැවතත් සිදුවන අභ්‍යන්තර ගැටුම් බැහැර කරන ඔවුහු මර්කෙල්ගේ දුර්වල නායකත්වය ගැන චෝදනා කරති.

මාධ්‍ය විවේචකයන්ට (හැන්ඩෙස්බ්ලාට් පුවත්පත) අනුව, "ආර්ථිකයට අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරන" ක්‍රියාත්මක කිරීමෙහි ලා අසමත් ආන්ඩුව අනවශ්‍ය අයුරින් විරෝධතා අවුලුවමින්, දරුනු සමාජ පියවර ක්‍රියාවට දැමීමට එහි ඇති නැඹුරුව ප්‍රකෝපකාරී ලෙස ප්‍රකාශ කිරීමෙන් එහි දුර්වලකම වසං කිරීමට වෑයම් කරයි.

මර්කෙල් විවේචනය කරන මෙම මාධ්‍ය ආයතන ම විපක්ෂ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (එස්පීඩී) හා එයටත් වඩා හරිතයන් කෙරෙහි හිතපක්ෂපාතීව කතා කරයි.

ජනගහන ඝනත්වය වැඩිම ජර්මන් ප්‍රාන්තය වන උතුරු රයින්-වෙට්ස්පාලියාහි එස්පීඩී-හරිත සුලුතර ආන්ඩුවක් මෑතක දී ස්ථාපනය කිරීම ජාතික මට්ටමේ දී විපක්ෂයේ පක්ෂ එකක් හෝ දෙකම ඇතුලත් නව ආන්ඩුවක් කරා යන ගමනේ එක් පියවරක් නියෝජනය කරයි.

වෙස්ට්පේලියාහි බලය මාරුවීමේ ප්‍රතිඵලයක් වසයෙන්, මර්කෙල්ගේ ආන්ඩුවට බුන්ඩෙස්ටාගයේ (පාර්ලිමේන්තුවේ ඉහල මන්ත්‍රනසභාවේ) බහුතරය අහිමිව ගොස් තිබෙන අතර දැන් නීති බලාත්මක කල හැක්කේ විපක්ෂයේ සහාය ඇතිව පමනි. එලැඹෙන සතියේදී වෙස්ට්පේලියාහි අගමැති වසයෙන් එස්පීඩීයේ හෙනෙලෝර් ක්‍රාෆ්ට් තෝරාගැනීමේ ඉඩ ප්‍රස්ථාව " එස්පීඩී-හරිත අනාගතයක උදාව" වසයෙන් *ෆ්‍රැන්ක්ෆර්ටර් රුන්ඩ්ස්චෝ* පුවත්පත උත්කර්ශයට නංවා තිබේ.

එස්පීඩී සහ හරිත යන දෙපාර්ශවයම මීට පෙර වෙස්ට්පේලියා හා ෆෙඩරල් මට්ටමේ ආන්ඩු පිහිටුවා තිබේ. වෙස්ටපේලියාහි මෙම "රතු-කොල" සන්ධානයේ නව්‍යතාව වන්නේ, විශාල බටහිර ජර්මන් රාජ්‍යයක ආන්ඩුවේ තීරනාත්මක සාධකයක් වසයෙන් වාම පක්ෂය ඊට ඇතුලත් කරගෙන තිබීම යි.

ඩසල්ඩෝෆ්හි එස්පීඩී-හරිත ආන්ඩුව මෙම සරත් ඍතුවේ දී සම්මත කරගැනීමට නියමිත ප්‍රාන්ත අයවැයේ දී එක් ඡන්දයක් පිටුපසින් සිටී. අවශ්‍ය කරන ඡන්දය සීඩීයූ හෝ එෆ්ඩීපීයෙන් ලැබෙන පාටක් පෙනෙන්නට නැත. සන්ධානය එම ඡන්දය ලබා

ගැනීමට වාම පක්ෂය කෙරෙහි බර තබනු ඇති අතර එනයින් වෙස්ට්පේලියාහි එස්පීඩීය හා හරිතයින් බලයේ සිටීම සහතික කරනු ඇත වාම පක්ෂය තමන්ගේ පැත්තෙන් එහි සහය ලබා දීමට නොඉවසිල්ලෙන් සිටියි.

වාම පක්ෂයේ නායක ගේසීන් ලොට්ෂ් 07 දින කොලොග්න්හි ස්ටාඩ්ට්-ඇන්ෂීගර් පත්‍රය සමග පැවති සම්මුඛ සාකච්ඡාවකදී කීවේ, "ආරම්භයේ සිටම අප කියා ඇත්තේ අප රුට්ගර්ස් (දැනට සිටින සීඩීයූ ප්‍රාන්ත අගමැති) ඉවත් කරන බව හා ප්‍රතිපත්ති වෙනසක් අවශ්‍ය බවයි."

මේ කාරනයේදී වාම පක්ෂය "මුලුමනින්ම විශ්වාසදායක" යයි ලොට්ෂ් කියා සිටියේය එය මූලික ප්‍රශ්න ගැන "සියයට 80ක එකඟතාව පලකර ඇති" බවත් අනෙක්වා පිලිබඳව සාකච්ඡා කිරීමට කැමත්තෙන් පසුවන බවත් පැවසීය.

වෙස්ට්පේලියාහි නව ආන්ඩුවක් ස්ථාපනය කිරීම හා හෙසෙහි මාස 18කට ඉහතදී පැවති තත්වය අතර පැහැදිලි වෙනසක් පවතී. 2008 අගභාගයේ හෙසේ ප්‍රාන්ත මැතිවරනයෙන් අනතුරුව වාම පක්ෂයේ සහාය ද ලබාගනිමින් ආන්ඩුවක් පිහිටුවීමට එස්පීඩී කලාපීය සභාපතිනිය වෑයම් කලේය. එහෙත් ඇගේම පාර්ලිමේන්තු කන්ඩායමේ එස්පීඩී දක්ෂිනාංශිකයන්, මාධ්‍ය හා ජාතික එස්පීඩීය එයට අකුල් හෙලීය.

තත්වය දැන් වෙනස්වී තිබේ. පසුගිය කාලයේ ව්‍යාපාරික උපදේශකයෙක් සහ එස්පීඩී දක්ෂිනාංශයට සමීපව වැඩ කල හෙනෙලෝර් ක්‍රාෆ්ට්, වාම පක්ෂය සමග මොනයම්ම හෝ සන්ධානගතවීමක් කෙරෙහි ඇගේ විරෝධය සැඟවීමට තැත් කලේ නැත. ඇගේ ස්ථාවරය වෙනස් කලේ, එස්පීඩී නායක සිග්මර් ගේබ්‍රියල් සහ බොහෝ මාධ්‍යවල පීඩනය යටතේ පමනකි.

එස්පීඩීයේ හා මාධ්‍යවල පුලුල් කොටස් තුල ඇතිව තිබෙන මෙම වෙනස කෙසේ පැහැදිලි කල හැකි ද?

2008 වර්ෂය අවසානයේදී ආර්ථික අර්බුදය පුපුරා යාමට පටන් ගත්තා පමනක් වන අතර පාලනය කරගත හැකි සේ පෙනී ගියේය. එකල ෆෙඩරල් ආන්ඩුව එස්පීඩී හා සීඩීයූ මහා සන්ධානයක් වූ අතර පාලක පන්තිය එක්කෝ දිගටම එය පවත්වා ගැනීමට උත්සහා කලේය නැතිනම් ඒ වෙනුවට සීඩීයූ-සීඑස්යූ-එෆ්ඩීපී සන්ධානයක් ගෙනඒමට මං සෙවුවෝය. ආන්ඩුව තුල වාම පක්ෂයේ ක්‍රියාකලාපය අනර්ථකාරී හා අනවශ්‍ය එකකැයි සලකන ලද අතර අවිනිශ්චිත සාධකයක් වශයෙන් එය දැක ගනු ලැබින.

මාස 15ක් පමන ගත වූ තැන, ආර්ථික අර්බුදයේ මුලු බලපෑම එය විසින්ම දැනෙන්නට සැලැස්වීය. පශ්චාත් යුද්ධ කාල පරිච්ඡේදයේ සුභ සාධන රාජ්‍යය විනාශ කරන යෝධ කප්පාදු පියවර හරහා අර්බුදයට කම්කරු පන්තියෙන් වන්දි අයකර ගැනීමට සියල්ලටත් වඩා ඉහලින් පාලක පන්තිය අදිටන් කොට සිටී. ධනපති පන්තියේ අවශ්‍යතාවන් සැපිරීමට අසමත්ව ඇති වත්මන් සන්ධානය අභ්‍යන්තරව බෙදී, ලාභ දේශපාලන අරමුනු ලුහුබඳිමින් සහ මහජනයා කෙරෙන් එල්ල වෙන වැඩෙන විරුද්ධත්වයකට මුහුන දී සිටී.

මෙම වාතාවරනය යටතේ වාම පක්ෂයට පවරනු ලැබූ කර්තව්‍ය වන්නේ එස්පීඩී-හරිත ආන්ඩුවකට ව්‍යාජ-වාම පැහයක් තැවරීමයි. මෙම සන්ධානය තමන්ගේ පැත්තෙන් නිසැකවම සිය කර්තව්‍ය කරගෙන යයි.

වාම පක්ෂයේ පිටුබලය ලබන වෙස්ට්පේලියානු " රතු-කොල" ආන්ඩුවට, වත්මන් ෆෙඩරල් ආන්ඩුව පෙන්නුම් කර ඇතිවාට වඩා බෙහෙවින් නිර්දය හා පලදායි වනු ඇති ක්‍රියාමාර්ග කම්කරු පන්තියට එරෙහිව ගැනීම සඳහා ප්‍රබල අභ්‍යන්තර එක්සත් බවක් ඇතිකර ගැනීමටත් වෘත්තීය සමිතිවලට එහි ඇති සමීප බැඳීම ප්‍රයෝජනයට ගැනීමටත් නියෝග කෙරී ඇත. ජර්මන් පාලක ප්‍රභූවේ මූලිකයන් ග්‍රීසිය, ස්පාඤ්ඤය සහ පෘතුගාලයේ දරුනු කප්පාදු පියවර ගනු ලැබුවේ වෘත්තීය සමිතිවල සහය ලද සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුවක් විසින් ය යන්න මනාව අවබෝධ කරගෙන සිටිති.

නව වෙස්ට්පේලියානු ආන්ඩුව ගෙර්හාඩ් ෂ්රෝඩර් විසින් නායකත්වය දෙනු ලැබූ එස්පීඩී-හරිත සන්ධානය ( 1998-2005) සහ ක්ලෝව්ස් වොවෙරීට් යටතේ බර්ලින් සෙනේට් සභාවේ එස්පීඩී-හරිත-වාම පක්ෂයේ මග පෙන්වීම ලබනු ඇත. උක්ත සිදුවීම් දෙකේදී ම, සමාජ වැඩපිලිවල් මත සහ කම්කරු පන්තියේ ජීවන තත්වයන් මත ම්ලේච්ඡ ප්‍රහාර එල්ල කරනු ලැබුවේ ධනපති පන්තියේ "වාම"පක්ෂ විසිනි.

පසුගිය වසර අවසානයේ වෙස්ට්පේලියා ප්‍රාන්තයේ යුරෝ බිලියන 122.1 ක්වූ රාජ්‍ය නය මෙම වසරේදී යුරෝ බිලියන 129.1ක මට්ටමට නැගෙනු ඇතැයි

අපේක්ෂා කෙරේ. වර්තමානයේදී බැංකුවලට ගෙවිය යුතු පොලිය ඩොලර් බිලියන 4.6ක මට්ටමේ පවතින අතර එක එල්ලේ වැඩෙමින් තිබේ. රුදුරු ලෙස සමාජ වියදම් කැපීම සැලසුම් කෙරෙමින් තිබේ.

වෙස්ට්පේලියාවේ බලයට ඒම කඩාකප්පල් නොකර ගනු වස් එස්පීඩී හා හරිතයෝ දරුනු කප්පාදු වැඩසටහන් ගෙනඒම මෙම ශරත් සෘතුවේ පැවත්වූ අයවැය සාකච්ඡා තෙක් පමා කලෝය. සන්ධාන ගිවිසුමේ අවධාරනය කර තිබෙන දිවා සුරැකුම් මධ්‍යස්ථාන පුලුල් කිරීම හා පන්ති ගාස්තු ගෙවීම අහෝසි කිරීම යන්නෙන් ප්‍රාථමිකව ම අදහස් කරනු ලැබුවේ පටි තදකිරීමේ පියවර ශරත් සෘතුවේ නිවේදනය කරන විට අවශ්‍යවනු ඇති වෘත්තීය සමිති සහ සමාජ සංවිධානවල සහය දිනා ගැනීමයි. සන්ධාන ගිවිසුම පිලිබඳ නිවේදනය කිරීමෙන් අනතුරුව ඉතා ඉක්මනින් අයිජී මැටෝල් දිස්ත්‍රික් අධ්‍යක්ෂ ඔලිවර් බර්ක්හාඩ්ට් සඳහන් කලේ ඔහුගේ වෘත්තීය සමිතිය එහි සම්පූර්න සහාය හා පිටුබලය නව ආන්ඩුවට පිරිනමනු ඇති බවයි.

ෆෙඩරල් මට්ටමේ දේශපාලන ප්‍රතිසන්ධානයක් සඳහා වන මෙම අත්හදා බැලීමේ පරීක්ෂනයේදී වාම පක්ෂයට ධනේශ්වර පාලනයේ වැදගත් දේශපාලන මුක්කුවක් ලෙස සේවය කිරීමට ඇති එහි ශක්‍යතාව හා කැමත්ත සනාථ කිරීමට සිදුව තිබේ.

වාම පක්ෂයේ පිටුබලය හෝ වාම පක්ෂය ද ඇතුලත් එස්පීඩී-හරිත සන්ධානයක් පාලනයේ ඒකාධිපති රූපාකාරයන් හඳුන්වා දීමට එකහෙලාම පෙරමුන ගනු ඇත. තමන්ට හෝ වෘත්තීය සමිතිවලට පාලනය කරගත නොහැකි සමාජ විරුද්ධත්වයට පෙරලා පහරදීමට රුදුරු ක්‍රමෝපායන් යොදා ගැනීමට එවැනි ආන්ඩුවක් දෙවරක් නොසිතනු ඇත.

1930 ගනන්වල ස්පාඤ්ඤයේ සහ ප්‍රන්සයේ මහජන පෙරමුනු ආන්ඩු වැනි ඊනියා "වාම" ආන්ඩු සමාජ විරුද්ධත්වය මැඩලා දක්ෂිනාංශික හා ෆැසිස්ට් තන්ත්‍රයන්ට මාවත විවරකර දී ඇති සැටි අතීතයට යොමන එක බැල්මකින් වුව ද පෙනී යයි. එවැනි වර්ධනයක අනතුර හන්ගේරියාව සහ නෙදර්ලන්තයේ මෑත සිදුවීම් මගින් විදහා දැක්වීය. රටවල් දෙකෙහිම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ ව්‍යසනකාරී සමාජ අර්බුදයක් පාලනය කල අතර අන්ත දක්ෂිනාංශික පක්ෂවල අත් ශක්තිමත් කලේය.

වත්මන් ෆෙඩරල් හවුල් ආන්ඩුව සමග සන්සන්දනය කරන විට එස්පීඩී-හරිත-වාම පක්ෂ ආන්ඩුවක් "අඩු නපුරක්" වෙනු ඇතැයි යන කියාපෑම ව්‍යාජ ය. කම්කරු පන්තිය වාම පක්ෂයේ අවස්ථාවාදී පිලිවෙත් ප්‍රතික්ෂේප කල යුතු අතර ස්වාධීන දේශපාලන බලයක් ලෙස මැදිහත් විය යුතුය. එය ඉල්ලා සිටින්නේ ධනවාදයට එරෙහිව එහි පතුලේ පවතින ප්‍රශ්න සමග පොරබදින නව පක්ෂයක් එනම් පාටි ෆර් සෝසියාලේ ග්ලීචීට් (සමාජවාදී සමානතා පක්ෂය) ගොඩ නැගීමයි.

උලී රිපර්ට්

© www.wsws.org